# 4 ව්‍යාපාර ගනුදෙනු වාර්තා කිරීම

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

4.1 ව්‍යාපාරික ගනුදෙනු සහ ගිණුම්කරණ සමීකරණය

4.2 ගනුදෙනු සහ ද්විත්ව සටහන් න්‍යාය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ව්‍යාපාර ගනුදෙනු ක්‍රමානුකූලව වාර්තා කරමු

පසුගිය දිනක අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කළ දීප ව්‍යාප්ත කෙටි නාට්‍ය තරගාවලියේ දී ප්‍රථම ස්ථානය "ජයග්‍රහණය" නම් වූ කෙටි වේදිකා නාට්‍යයට හිමි විය. එහි අඩංගු දෙබස් කාණ්ඩ කිහිපයක් කෙරෙහි ඔබගේ අවධානයට යොමු කරමි.

අප්පුහාමි : ධනපාල පුතේ .... මේ කඩේ මෙහෙ ම තිබ්බට, පටන් ගත්තේ බොහෝම පොඩියට. ඒ කාලේ වැඩේට යෙදෙව්වේ රුපියල් දෙළහක් විතර වෙන්නැති.

ධනපාල : අනේ අප්පච්චි, කොහොමද ඒ වගේ පොඩි ගාණකින් මේ වගේ ව්‍යාපාරයක් පටන් ගත්තේ.

අප්පුහාමි : ඒක තමයි පුතේ, අද කාලේ හැටියට ඉගෙන ගන්න ඕන සාස්තරේ. මේ අහන්න, මේක ඉස්සෙල්ලා ම මගේම සල්ලි ටිකක් දාලා තමයි පටන් ගත්තේ. පස්සේ ටිකක් දියුණු කරගන්න ඕනේ කියලා හිතලා, හන්දියේ බැංකුවෙන් ණයකුත් ගත්ත මගෙ හිතේ. ඒ දවස්වල වෙළෙඳාම හරි ජය යි.

හැබැයි පුතේ, එද ඉඳලා අද වෙනකම්ම කරන හැම ගනුදෙනුවක් ම මම ආන්... අර වගේ පොතක ලියා ගන්නවනේ. ඒ වගේ ම පුතේ මම කිසි වෙලාවක කඩේ ගනුදෙනුයි, මගේ ගෙදර ගනුදෙනු යි පටලව ගත්තේ නැහැ. මේවා පුතේ සම්පත් නේ. හරියටම ඒවා පාලනය කළේ නැත්නම් අපරාදේ විනාශ වෙනවනේ.

ධනපාල : ඉතින් අප්පච්චි, වාණිජ අංශයෙන් ඉගෙන ගන්නේ නැතිව කොහොමද අපුරුවට ගනුදෙනු සටහන් තියා ගත්තේ ?

අප්පුහාමි : මේකනේ පුතේ, ඒ දවස්වල පුතාලගේ අම්මගේ පොඩි නංගිගේ පුතා ඔය සති අන්තේ දවස්වල කඩේට ඇවිල්ලා ඔන්න ඔය ගිණුම් කියලා මොනවදෝ පොත්වල ලිව්වා. මම නම් ඒව දන්නේ නැහැ.

දවසක් මම ගියානේ බැංකුවෙන් ණයක් ගන්න. නිකමට වගේ ඔය හදපු ගිණුම් පොත් ටිකත් මම උස්සාගෙන ගියා. මේව දැක්ක විතරයි බැංකුවේ මහත්තය සුටුස් ගාලා මගේ වැඩේ කරල දුන්නා.

ඉහත දෙබස් කාණ්ඩය අවධානයෙන් කියවූ ඔබගේ සිත තුළ විවිධ අදහස් පැන නැගුන බව නොරහසකි. අපි තව දුරටත් ව්‍යාපාරයක සිදුවන ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට හා ඒවා පොත්වල සටහන් කරන ආකාරය අවබෝධ කර ගැනීමට උත්සාහ ගනිමු.

## හැඳින්වීම

ව්‍යාපාරයක ක්‍රියාකාරිත්වය සඳහා සම්පත් අවශ්‍ය වේ. ව්‍යාපාරය මෙම සම්පත් ව්‍යාපාරිකයාගෙන්/ ව්‍යාපාරිකයන්ගෙන් මෙන් ම බාහිර පාර්ශ්වයන්ගෙන් ද සපයා ගනු ඇත. එසේ වුව ද ව්‍යාපාරය යන්න එහි අයිතිකරුගෙන්/අයිතිකරුවන්ගෙන් වෙන් වූ ස්වාධීන ඒකකයක් බව ගිණුම්කරණයේ දී උපකල්පනය කෙරේ. ඒ අනුව ව්‍යාපාරයේ සම්පත් හා ඒවා සපයන පාර්ශ්වවලට එම සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම ගිණුම්කරණ සමීකරණයෙන් පිළිබිඹු වේ.

ව්‍යාපාරයක් මෙම සම්පත් භාවිත කරමින් විවිධ මෙහෙයුම් කටයුතු සිදු කරයි. මේවා පොදුවේ ගනුදෙනු ලෙස හඳුනාගත හැකි ය. ව්‍යාපාරික ගනුදෙනුවක් මගින් ව්‍යාපාරය නැමති ඒකකයට බලපෑම් දෙකක් ඇති කරයි. මෙම ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් න්‍යාය නමැති ක්‍රමයට අනුව ගිණුම නමැති සටහනක ලිවීම ගනුදෙනු ගිණුම් ගත කිරීම ලෙස හඳුන්වයි. මෙසේ ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි සෑම ගනුදෙනුවක් ම ද්විත්ව සටහන් න්‍යායට අනුව ගිණුම්ගත කරනු ඇත.

මෙම පරිච්ඡේදය කියවන ඔබට පහත දැක්වෙන මූලික යෙදුම් පිළිබඳ ව අවබෝධය ලැබෙනු ඇත.

- සම්පත්
- වත්කම්
- අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය)
- වගකීම්
- ගනුදෙනු
- ගිණුම්කරණ ඒකක සංකල්පය
- ගිණුම්කරණ සමීකරණය
- ද්විත්ව සටහන් න්‍යාය
- ගිණුම
- ගනුදෙනු සටහන් කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 4.1 ව්‍යාපාරික ගනුදෙනු සහ ගිණුම්කරණ සමීකරණය

සෑම ව්‍යාපාරයක ම මූලික අරමුණ ලාභ ඉපයීමයි. එනිසා ව්‍යාපාරවලට ආර්ථික පැවැත්මක් ඇත. මේ සඳහා ව්‍යාපාරය බාහිර පාර්ශ්වයන් සමග සම්පත් හුවමාරු කරගනු ඇත. ව්‍යාපාරයක මෙහෙයුම් ක්‍රියාවලියේ දී (එදිනෙද කටයුතුවල දී) යොද ගන්නා සියලු දේ සම්පත් ලෙස හැඳින් වේ.

පහත නිදසුන් තුළින් ව්‍යාපාරයක් යොද ගන්නා විවිධ සම්පත් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවනු ඇත.

- යන්ත්‍ර සූත්‍ර, මෝටර් රථ, ගොඩනැගිලි යනාදී භෞතික සම්පත්.
- කළමනාකරුවන්, සුපරීක්ෂකවරුන්, ලිපිකරුවන්, කම්කරුවන් යනාදී මානව සම්පත්.
- ව්‍යාපාරිකයා යොදවන මුදල්, බැංකු සහ වෙනත් ආයතනවලින් ලබා ගන්නා ණය මුදල් යනාදී මූල්‍ය සම්පත්.
- විවිධ පුද්ගලයන්, ආයතන සහ අන්තර්ජාලය යනාදියෙන් ලබා ගන්නා තොරතුරු.

මෙසේ ව්‍යාපාරය බාහිර පාර්ශව සමග සම්පත් හුවමාරු කර ගැනීමේ ප්‍රතිඵල ලෙස සම්පත්වල ප්‍රමාණාත්මක ව මෙන් ම, මුදල් වටිනාකමේ ද වෙනස්කම් සිදු වේ. ව්‍යාපාරයක සම්පත් "වත්කම්" යනුවෙන් ද හැඳින් වේ.

**"ව්‍යාපාරය සහ විවිධ පාර්ශ්වයන් අතර ඇතිවන සම්පත් හුවමාරු වීම හෝ ආර්ථික සිදුවීම්" ගනුදෙනු (Transactions) ලෙස හැඳින්වේ.**

ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාමේ දී නොයෙක් ස්වරූපයේ ගනුදෙනු සිදු වේ. පහත නිදසුන බලන්න.

නිදසුන් * (01) පියුමි විසින් ආරම්භ කොට පවත්වාගෙන යන ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ගනුදෙනු | (1) | 20xx.05.01 | පියුමි රුපියල් 50,000 ක් යොද ව්‍යාපාරයක් ආරම්භ කිරීම. |
| | (2) | 20xx.05.07 | ව්‍යාපාරය රුපියල් 10,000ක් බැංකුවේ තැන්පත් කරමින් ජංගම ගිණුමක් ඇරඹීම. |
| | (3) | 20xx.05.10 | රුපියල් 20,000 ක් වටිනා බඩු තොගයක් නුවන්ගෙන් ගැනීම. |
| | (4) | 20xx.05.13 | බැංකුවෙන් රුපියල් 30,000 ක ණයක් ලබා ගැනීම. |
| | (5) | 20xx.05.14 | ව්‍යාපාරය රුපියල් 5,000 ක දුරකථන ගාස්තු ගෙවීම. |


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

(6) 20xx.05.17 රුපියල් 5,000 ක් බැංකු ණයෙන් කොටසක් ලෙස ගෙවීම.

(7) 20xx.05.18 ප්‍රසන්නට රුපියල් 3,000 ක බඩු තොගයක් විකිණීම.

(8) 20xx.05.19 රුපියල් 2,500 ක බදුකුලී ආදායමක් ව්‍යාපාරයට ලැබීම.

(9) 20xx.05.21 බැංකු තැන්පත්වලින් රුපියල් 4,000 ක් ආපසු ලබා ගැනීම.

(10) 20xx.05.23 පියුමි ව්‍යාපාරයෙන් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රුපියල් 1,000 ක බඩු තොගයක් ලබා ගැනීම.

(11) 20xx.05.27 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් මිලට ගැනීමට තීරණය කිරීම.

(12) 20xx.05.29 ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීම.

ඉහත සඳහන් නිදසුන් දෙස අවධානය යොමු කිරීමේ දී ව්‍යාපාරයක නොයෙකුත් ස්වරූපයේ ගනුදෙනු සිදුවිය හැකි නමුත්, ගිණුම් පොත්වල සටහන් කරනුයේ මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණි. එනිසා ඉහත නිදසුන් (01) හි අඩංගු අංක 11 සහ 12 ට අදාළ ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කරනු නොලැබේ.

## ගිණුම්කරණ ඒකක සංකල්පය (Accounting entity concept )

ව්‍යාපාරයකට ආර්ථික පැවැත්මක් තිබෙන හෙයින්, එහි විවිධ ස්වරූපයේ ගනුදෙනු සිදුවන බව ඔබ මේ වන විටත් දන්නා කරුණකි. ගිණුම්කරණයේ දී ව්‍යාපාරය, ව්‍යාපාරිකයාගෙන් වෙන්ව පවතින ස්වාධීන ඒකකයක් ලෙස සිතා කටයුතු කෙරේ. එය **ගිණුම්කරණ ඒකක සංකල්පය** ලෙස හැඳින්වේ. එනිසා ව්‍යාපාරික ගනුදෙනු, ගිණුම් වාර්තාවල සටහන් කිරීමේ දී අයිතිකරුගේ දෘෂ්ටිකෝණයෙන් නොව ව්‍යාපාරයේ දෘෂ්ටිකෝණයෙන් සටහන් කෙරේ.

## ගිණුම්කරණ සමීකරණය (Accounting equation)

"ව්‍යාපාරයක සම්පත් (වත්කම්) හා, සම්පත් සපයන පාර්ශවවලට එම සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම් පිළිබිඹු කෙරෙන ගණිතමය ඉදිරිපත් කිරීම" **ගිණුම්කරණ සමීකරණය නම් වේ.**

මේ අනුව ගිණුම්කරණ සමීකරණයෙන් නිරූපණය වන විචල්‍යයන් දෙකකි.

- ව්‍යාපාරයේ ආර්ථික සම්පත් (වත්කම්)
- එම ආර්ථික සම්පත් යෙදවූ පාර්ශවයන්ට ව්‍යාපාරයේ ඇති බැඳීම. (වගකීම්)

ඉහත සඳහන් තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේ දී ඉතා සරල ගිණුම්කරණ සමීකරණයක් ව්‍යාපාරික ගනුදෙනු තුළින් නිර්මාණය වන බව පැහැදිලි ය.

| | | |
|---|---|---|
| වත්කම් (Assets) | = | වගකීම් (Liabilities) |

ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වා ගෙන යාමේදී ඊට අවශ්‍ය ආර්ථික සම්පත් පොදුවේ පාර්ශවයන් දෙකක් විසින් සපයනු ඇත.

- ව්‍යාපාරයේ හිමිකරු/හිමිකරුවන්
- අනෙකුත් බාහිර පාර්ශවයන්

ඉහත සඳහන් පරිදි ව්‍යාපාරයට සම්පත් යෙදවූ පාර්ශවයන්ට, ව්‍යාපාරයේ ඇති බැඳීම (වගකීම්) කොටස් දෙකකි.

ඒ අනුව, ව්‍යාපාරයට හිමිකරුවන් සම්බන්ධ ව ඇති බැඳීම **ප්‍රාග්ධනය** ලෙසත්, බාහිර පාර්ශවයන් වෙත ඇති බැඳීම **වගකීම්** ලෙසත් ඉදිරිපත් කළ හැකි ය. එවිට මූලික ගිණුම්කරණ සමීකරණය පහත පරිදි ගොඩ නැගේ.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය) | + | වගකීම |
| (Assets) | = | (Owner's Equity) (Capital) | + | (Liabilities) |

මෙසේ අප විසින් ගොඩ නගා ගත් මූලික ගිණුම්කරණ සමීකරණයේ විචල්‍යයන් පහත පරිදි ද දැක්විය හැකි ය.

- අයිතිකරුගේ හිමිකම = වත්කම් - වගකීම්
- වගකීම් = වත්කම් - අයිතිකරුගේ හිමිකම
- වත්කම් = වගකීම් + අයිතිකරුගේ හිමිකම

## 4.2 ගිණුම්කරණ සමීකරණයේ සංරචක

**වත්කම්**

**"ව්‍යාපාරයක පවත්නා ආර්ථික සම්පත් සමූහය" වත්කම් වේ.**

ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතුවල දී එම කටයුතුවල ස්වභාවය මත විවිධ ස්වරූපයේ වත්කම් නිර්මාණය වේ. එනිසා ව්‍යාපාරය විසින් අත්කර ගෙන තිබෙන හෝ පාලනය කරනු ලබන අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ සමූහය ලෙස ද වත්කම් හඳුනාගත හැකි ය.

ව්‍යාපාරයක වත්කම්වල පහත දැක්වෙන ලක්ෂණ පවතී.

- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වීම.
- ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.
- අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ලබා දීම.
- එහි පිරිවැය විශ්වසනීයතාවකින් මැනීමට හැකි වීම.

ව්‍යාපාරයක විවිධ ස්වභාවයේ වත්කම් පවතී.

**ව්‍යාපාරයක ක්‍රියාකාරීත්වය මත සිදුවන වෙනස්වීම්වලට අනුව මෙම වත්කම් කොටස් දෙකකට බෙදිය හැකි ය.**

### ජංගම වත්කම්

මාස 12 ක් හෝ ඊට වඩා අඩු කාලයක් හෝ පවතින, එමෙන් ම එදිනෙදා ව්‍යාපාරික කටයුතු තුළින් නිරන්තරව වෙනස්වීම්වලට භාජනය වන වත්කම් වේ. මේවා **කෙටිකාලීන වත්කම්** ලෙස ද හැඳින් වේ.

අවසන් බඩු තොගය, වෙළෙඳ ණයගැතියෝ, අතැති මුදල් යනාදීය මීට නිදසුන් වේ.

### ජංගම නොවන වත්කම්

මාස 12 ට වැඩි කාලයක් පවතින එදිනෙදා ව්‍යාපාරික කටයුතු නිසා විශාල වෙනසක් ඇති නොවන වත්කම් සමූහය වේ. **දිගුකාලීන වත්කම්** ලෙස ද මේවා නම් කෙරේ. යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, රථ වාහන යනාදිය මීට නිදසුන් වේ.

## අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය)

**"ව්‍යාපාර ඒකකයට අයිතිකරු/අයිතිකරුවන් යොදවනු ලබන සම්පත්වල අගය" අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය) නම් වේ.**

අයිතිකරුට/අයිතිකරුවන්ට මුදල් හෝ වෙනත් වත්කම්වලින් ද තම ප්‍රාග්ධනය ව්‍යාපාරයට යෙදවිය හැකි ය. ව්‍යාපාරයේ ස්වභාවය (සංවිධාන ක්‍රමය) අනුව විවිධ නාමයන් ප්‍රාග්ධනය සඳහා භාවිත කෙරේ.

නිදසුන් ඃ

- තනි ව්‍යාපාර අයිතිකරුගේ ධනය/හිමිකම
- හවුල් ව්‍යාපාර හවුල්කරුවන්ගේ ධනය/හිමිකම
- සීමිත සමාගම් කොටස්කරුවන්ගේ හිමිකම

## වගකීම්

**"ව්‍යාපාරික වත්කම් අත්පත් කර ගැනීම පිණිස ව්‍යාපාරයේ අයිතිකරුවන් යෙදවූ ප්‍රාග්ධනයට අමතර ව බාහිරින් යෙදවූ අරමුදල්" වගකීම් වේ.**

ව්‍යාපාරික වගකීම්වල පහත සඳහන් ලක්ෂණ පවතී.

- අතීත ගනුදෙනුවක් තුළින් බිහිවූ බැඳීමක් වීම.
- අදළ ගෙවීම් ප්‍රමාණය විශ්වසනීයතාවයකින් මැනිය හැකි වීම.
- බැඳීම් නිරවුල් කිරීමේ දී ව්‍යාපාරය සතු වත්කම් ව්‍යාපාරයෙන් පිටතට ඇදී යාම.

**ව්‍යාපාරික වගකීම් නිදහස් කළහැකි කාලය අනුව ඒවා පහත පරිදි කොටස් දෙකකට බෙදේ.**

### ජංගම වගකීම්

ව්‍යාපාරයක් විසින් මාස 12 ක් හෝ එයට අඩු කාලයකින් හෝ නිදහස් කළයුතු බැඳීම් සමූහය වේ.

වෙළෙඳ ණය හිමියෝ, බැංකු අයිරාව, ගෙවිය යුතු වියදම් යනාදිය මීට නිදසුන් වේ.

### ජංගම නොවන වගකීම්

ව්‍යාපාරය වර්ෂයකට වැඩි කාල සීමාවකින් නිදහස් කළහැකි බැඳීම් සමූහය වේ. බොහෝ විට මේවා සඳහා ඇප සුරැකුම් තැබීමට ව්‍යාපාරයට සිදු වේ.

අවුරුදු 10 න් ගෙවිය යුතු බැංකු ණය, සීමිත සමාගම් නිකුත් කරන ණයකර යනාදිය මීට නිදසුන් වේ.

## ව්‍යාපාරික ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ සංරචකයන්ට බලපාන අයුරු

ව්‍යාපාරයක එදිනෙදා සිදුවන ගනුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයේ සංරචකයන්ගේ වටිනාකම් වෙනස් වේ. මෙම තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා පහත සඳහන් ගනුදෙනු අඩංගු නිදසුන කෙරෙහි අවධානය යොමු කරමු.

නිදසුන ඃ

- සමරසිංහ රුපියල් 50,000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
- ව්‍යාපාරයට මුදල් ප්‍රමාණවත් නොවූ හෙයින් රුපියල් 20,000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම.

ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාමේ දී ඊට අවශ්‍ය ආර්ථික සම්පත් මූලිකව ම සපයනු ලබන්නේ හිමිකරු/හිමිකරුවන් විසිනි. එසේ අයිතිකරු/අයිතිකරුවන් ව්‍යාපාරයට යොදවන ආර්ථික සම්පත් (මුදල් හෝ භාණ්ඩ) ප්‍රාග්ධනය නමින් හැඳින් වේ.

මේ අනුව ඔබගේ අවධානය ඉහත නිදසුනෙහි පළමු ගනුදෙනුව වෙත යොමු කිරීමෙන් එනම් සමරසිංහ රුපියල් 50,000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම මගින් පහත තත්ත්වයන් ඇති වී තිබේ.



ව්‍යාපාරයට රුපියල් 50,000 ක මුළු වටිනාකමක්/වත්කම් (මුදල්) නිර්මාණය වීමත්, ව්‍යාපාරයේ රුපියල් 50,000 ක වත්කම, හිමිකරුට (සමරසිංහ) හිමිකාරත්වයක් (ප්‍රාග්ධනය) ඇති වීමත් වේ.

මෙසේ සලකා බැලීමේ දී අදාළ ව්‍යාපාරික ගනුදෙනුව ඇසුරින් සරල ගිණුම්කරණ සමීකරණයක් ගොඩනගා ගත හැකි ය.

**වත්කම් = අයිතිකරුගේ හිමිකම** — 01

මේ අනුව පළමු ගනුදෙනුවට අදාළ ව ගිණුම්කරණ සමීකරණය මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

| වත්කම් (රු) | = | අයිතිකරුගේ හිමිකම (රු) |
|---|---|---|
| මුදල් 50,000 | = | ප්‍රාග්ධනය 50,000 |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ දී හිමිකරු/හිමිකරුවන් යොදවනු ලබන සම්පත් ප්‍රමාණවත් නොවන විටක දී වෙනත් බාහිර පාර්ශ්වයන්ගෙන් ද අවශ්‍ය සම්පත් සම්පාදනය කර ගනී. මෙසේ බාහිර පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට යොදවනු ලබන සම්පත් වගකීම් ලෙස නම් කෙරෙන බවත් අපි දනිමු.

මේ අනුව ඔබගේ අවධානය ඉහත නිදසුනේ දෙවන ගනුදෙනුව වෙත යොමු කරන්න. ව්‍යාපාරයට මුදල් ප්‍රමාණවත් නොවූ නිසා රුපියල් 20,000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීමෙන් පහත තත්ත්වයන් නිර්මාණය වේ.

ව්‍යාපාරයේ මුළු වටිනාකම/වත්කම් (මුදල්) රුපියල් 20,000 න් ඉහළ යාමත් ව්‍යාපාරයේ රුපියල් 20,000 ක වත්කම් සඳහා බැංකුවට හිමිකාරත්වයක් (වගකීම්) ඇති වීමත් වේ.

මෙසේ අදළ ව්‍යාපාරික ගනුදෙනුව ඇසුරින් පහත පරිදි ගිණුම්කරණ සමීකරණය ගොඩනගා ගත හැකි ය.

වත්කම් = අයිතිකරුගේ හිමිකම + වගකීම් (02)

මේ අනුව දෙවන ව්‍යාපාරික ගනුදෙනුව ද ඇතුළත් ව ගිණුම්කරණ සමීකරණය මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

| වත්කම් (රු) | = | අයිතිකරුගේ හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| මුදල් 70,000 | = | ප්‍රාග්ධනය 50,000 | + | බැංකු ණය 20,000 |

මෙසේ මූලික ගිණුම්කරණ සමීකරණයේ අඩංගු සංරචක සමූහය රූප සටහන 4.1 මගින් ඉදිරිපත් කළ හැකි ය.

4.1 රූප සටහන ගිණුම්කරණ සමීකරණයේ සංරචක

මේ වන විට ගිණුම්කරණ සමීකරණයේ සංරචක පිළිබඳවත්, ව්‍යාපාරික ගනුදෙනු තුළින් අදාළ ගිණුම්කරණ සමීකරණ සංරචකයන්ට ඇතිවන බලපෑම පිළිබඳවත් අවබෝධ කරගෙන ඇතැයි අපි සිතමු. තවදුරටත් එය පිළිබඳ ව පුළුල් අවබෝධයක් ලබා ගැනීම පිණිස පියුමිගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කරන්න.

පියුමිගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට ඇතිවන බලපෑම් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

### ගනුදෙනු 1

පියුමි රුපියල් 50,000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.



ව්‍යාපාරයට රු. 50,000 මුදල් වත්කමක් ඇතිවීම සහ රු. 50,000 ක හිමිකාරත්වයක් ඇති වීම.

| | | | | | |
|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
| (රු) | | | (රු) | | (රු) |
| මුදල් | 50,000 | = | ප්‍රාග්ධනය 50,000 | + | — |
| | 50,000 | | 50,000 | | — |

ගනුදෙනු 2

ව්‍යාපාරය රුපියල් 10,000 ක් බැංකුවේ තැන්පත් කරමින් ජංගම ගිණුමක් ඇරඹීම.

බැංකු වත්කම් රු. 10,000 ක් ඇතිවීම හා රු. 10,000 ක මුදල් වත්කම අඩුවීම.

| | | | | | |
|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
| (රු) | | | (රු) | | (රු) |
| මුදල් | 40,000 | = | ප්‍රාග්ධනය 50,000 | + | — |
| බැංකු | 10,000 | | | | |
| | 50,000 | | 50,000 | | — |

ගනුදෙනු 3

රුපියල් 20,000 ක් වටිනා බඩු තොගයක් නුවන්ගෙන් ගැනීම.



ව්‍යාපාරයට රු. 20,000 ක බඩු තොග වත්කමක් ඇතිවීම සහ නුවන් නමින් රු. 20,000 ක ණයහිමි වගකීමක් බිහි වීම.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් | |
| (රු) | | | (රු) | | (රු) | |
| මුදල් | 40,000 | = | ප්‍රාග්ධනය 50,000 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | | |
| බඩු තොගය | 20,000 | | | | | |
| | 70,000 | | 50,000 | | | 20,000 |


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ගනුදෙනු 4

බැංකුවෙන් රුපියල් 30,000 ක ණයක් ලබා ගැනීම.

ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 30,000 ක් වැඩි වීම සහ බැංකු ණය නමින් රු. 30,000 ක වගකීමක් ඇති වීම.

| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| (රු) | | | (රු) | | (රු) | |
| මුදල් | 70,000 | = | ප්‍රාග්ධනය 50,000 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | බැංකු ණය | 30,000 |
| බඩු තොගය | 20,000 | | | | | |
| | 100,000 | | 50,000 | | | 50,000 |

## ගනුදෙනු 5

ව්‍යාපාරය රුපියල් 5,000 ක් දුරකතන ගාස්තු ගෙවීම.

දුරකතන ගාස්තු ගෙවීම නිසා මුදල් වත්කම රු. 5,000 ක් අඩුවන අතර, අයිතිකරුගේ හිමිකම ද රු. 5,000 ක් අඩු වේ.

| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| (රු) | | | (රු) | | (රු) | |
| මුදල් | 65,000 | = | ප්‍රාග්ධනය 45,000 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | බැංකු ණය | 30,000 |
| බඩු තොගය | 20,000 | | | | | |
| | 95,000 | | 45,000 | | | 50,000 |

## ගනුදෙනු 6

රුපියල් 5,000 ක් බැංකු ණයෙන් කොටසක් ලෙස ගෙවීම.

මුදල් වත්කම රු. 5,000 න් අඩු වීම සහ බැංකු ණය වගකීම රු. 5,000 න් අඩු වීම.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | | + | වගකීම් | |
| (රු) | | | (රු) | | | (රු) | |
| මුදල් | 60,000 | = | ප්‍රාග්ධනය | 45,000 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | | බැංකු ණය | 25,000 |
| බඩු තොගය | 20,000 | | | | | | |
| | 90,000 | | | 45,000 | | | 45,000 |

## ගනුදෙනු 7

ප්‍රසන්නට රුපියල් 3,000 ක බඩු තොගයක් එම මුදලට ම විකිණීම.

ප්‍රසන්න නමින් රු. 3,000 ක ණයගැති වත්කමක් බිහි වීම සහ බඩු තොග වත්කම රු. 3,000 ක් අඩු වීම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | | + | වගකීම් | |
| (රු) | | | (රු) | | | (රු) | |
| මුදල් | 60,000 | = | ප්‍රාග්ධනය | 45,000 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | | බැංකු ණය | 25,000 |
| බඩු තොගය | 17,000 | | | | | | |
| ණය ගැතියෝ | 3,000 | | | | | | |
| | 90,000 | | | 45,000 | | | 45,000 |

## ගනුදෙනු 8

රුපියල් 2,500 ක බදුකුලී ආදායමක් ව්‍යාපාරයට ලැබීම.

මුදල් වත්කම රු. 2,500 ක් වැඩි වීම හා රු. 2,500 කින් අයිතිකරුගේ හිමිකාරත්වය වැඩි වීම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | | + | වගකීම් | |
| (රු) | | | (රු) | | | (රු) | |
| මුදල් | 62,500 | = | ප්‍රාග්ධනය | 47,500 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 10,000 | | | | | බැංකු ණය | 25,000 |
| බඩු තොගය | 17,000 | | | | | | |
| ණය ගැතියෝ | 3,000 | | | | | | |
| | 92,500 | | | 47,500 | | | 45,000 |


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

### ගනුදෙනු 9

බැංකුවෙන් රු. 4,000 ක් ආපසු ලබා ගැනීම.

මුදල් වත්කම රු. 4,000 ක් වැඩිවන අතර බැංකු වත්කම රු. 4,000 ක් අඩු වේ.

| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| (රු) | | | (රු) | | | (රු) | |
| මුදල් | 66,500 | = | ප්‍රාග්ධනය | 47,500 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 6,000 | | | | | බැංකු ණය | 25,000 |
| බඩු තොගය | 17,000 | | | | | | |
| ණය ගැතියෝ | 3,000 | | | | | | |
| | 92,500 | | | 47,500 | | | 45,000 |

### ගනුදෙනු 10

පියුමි ව්‍යාපාරයෙන් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රුපියල් 1,000 ක බඩු තොගයක් ලබා ගැනීම.

ව්‍යාපාරයේ බඩුතොග වත්කම රු. 1,000 ක් අඩු වන අතර ව්‍යාපාරිකයා තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගනු ලබන සියලු දේ (භාණ්ඩ/මුදල්) ගැනිලි වන හෙයින් ඔහුගේ හිමිකාරත්වයෙන් රු.1,000 ක් අඩු වේ.

| වත්කම් | | = | අයිතිකරුගේ හිමිකම | | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| (රු) | | | (රු) | | | (රු) | |
| මුදල් | 66,500 | = | ප්‍රාග්ධනය | 46,500 | + | ණය හිමියෝ | 20,000 |
| බැංකු | 6,000 | | | | | බැංකු ණය | 25,000 |
| බඩු තොගය | 16,000 | | | | | | |
| ණය ගැතියෝ | 3,000 | | | | | | |
| | 91,500 | | | 46,500 | | | 45,000 |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම් 01

සනත්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

i. සනත් රු. 100,000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
ii. රු. 10,000 ක යන්ත්‍රයක් මිලට ගැනීම.
iii. ව්‍යාපාරය රු. 50,000 ක් වටිනා ඉඩම් කැබැල්ලක් මිලට ගැනීම.
iv. ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු. 25,000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම.
v. නුවන්ගෙන් රු. 7,000 ක බඩු තොගයක් ගැනීම.
vi. රු. 15,000 ක් බැංකුවේ තැන්පත් කිරීම.
vii. රු. 3,000 ක බඩු තොගයක් එම මුදලට ම විකිණීම.
viii. බැංකුවෙන් රු. 5,000 ක් ආපසු ගැනීම.
ix. නුවන්ට රු. 2,000 ක් ගෙවීම.
x. රු. 1,000 ක බඩු තොගයක් රු. 1,500 කට අජිත්ට විකිණීම.

ඔබගේ මිතුරා හෝ මිතුරිය සමග සාකච්ඡා කරමින්,

අ. ඉහත සඳහන් එක් එක් ව්‍යාපාරික ගනුදෙනුව මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම වෙන වෙන ම දක්වන්න.

ආ. ඉහත 'අ' යටතේ පිළිතුරු ලෙස සැකසූ අවසාන මූලික ගිණුම්කරණ සමීකරණය සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| අයිතම | වටිනාකම (රුපියල්) | අයිතම | වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | ........ | ජංගම නොවන වත්කම් | |
| | | ඉඩම් | ........ |
| | | යන්ත්‍රෝපකරණ | ........ |
| ජංගම නොවන වගකීම් | | ජංගම වත්කම් | |
| බැංකු ණය | ........ | තොග | ........ |
| | | ණය ගැතියෝ | ........ |
| | | බැංකු මුදල් | ........ |
| | | මුදල් | ........ |
| ජංගම වගකීම් | | | |
| ණය හිමියෝ | ........ | | |
| | | | |

## ක්‍රියාකාරකම් 02

ඔබේ මිතුරා හෝ මිතුරිය සමග පහත සඳහන් සමීකරණයට අදාළ අගයන් සොයා ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| • | වගකීම් | = | වත්කම් | | |
| | (රු) | | (රු) | | |
| | 100,000 | = | ? | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| • | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් | = | වත්කම් |
| | (රු) | | (රු) | | (රු) |
| | ? | + | 40,000 | = | 200,000 |

| | | | | |
|---|---|---|---|---|
| • | අයිතිකරුගේ හිමිකම | = | වත්කම් | වගකීම් |
| | (රු) | | (රු) | (රු) |
| | ? | = | 100,000 | 20,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| • | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
| | (රු) | | (රු) | | (රු) |
| | ? | = | 150,000 | + | 25,000 |

| | | | | |
|---|---|---|---|---|
| • | වගකීම් | = | වත්කම් | අයිතිකරුගේ හිමිකම |
| | (රු) | | (රු) | (රු) |
| | 20,000 | = | 160,000 | ? |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 4.2 ගනුදෙනු සහ ද්විත්ව සටහන් න්‍යාය

ව්‍යාපාරයක ක්‍රියාකාරිත්වයේ දී විවිධ ස්වරූපයේ ගනුදෙනු සිදු වේ. මෙහි දී ව්‍යාපාරික සම්පත්වල ස්වභාවයේ ඇතිවන වෙනස් වීම් මුදලින් මැන ගිණුම් පොත්වල සටහන් කෙරේ. මෙසේ ගිණුම්කරණයේ දී අදාළ ගනුදෙනු සටහන් කරනුයේ ද්විත්ව සටහන් න්‍යායට අනුව ය. මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කරනුයේ ද්විත්ව සටහන් න්‍යාය පිළිබඳ ව අවබෝධයක් ඔබ හට ලබා දීම ය.

මුදලින් මැන දැක්විය හැකි සෑම ව්‍යාපාරික ගනුදෙනුවක ම ද්විත්ව ස්වරූපයක් පවතින බව මේ වනවිටත් ඔබ විසින් අවබෝධ කරගෙන ඇත. ද්විත්ව යනු ක්‍රියාකාරීත්වයන් දෙකකි. මෙම ද්විත්ව ස්වරූපය ගිණුම්කරණයේ දී "හර" සහ "බැර" වශයෙන් හඳුනාගනී.

"හර වටිනාකමට සමාන බැර වටිනාකම ඇති කෙරෙන පරිදි සෑම ගනුදෙනුවක් ම **ගිණුම් දෙකක එකවර සටහන් කෙරෙන පරිදි ගිණුම් තැබීමේ ක්‍රමය**" ද්විත්ව සටහන් න්‍යාය (Double entry system) වේ.

මෙම ද්විත්ව සටහන් න්‍යාය පිළිබඳ ව මුලින් ම අදහස් ඉදිරිපත් කරනු ලැබුවේ ක්‍රි.ව. 1494 දී **ලුකා පැසියෝලි** නම් ඉතාලි ජාතික ගණිතඥයෙකු විසිනි.

ද්විත්ව සටහන් න්‍යාය භාවිතය සඳහා ව්‍යාපාරික ගනුදෙනුවල ද්විත්ව බලපෑම නිවැරදිව හඳුනා ගැනීම වැදගත් වේ. මේ අනුව සෑම ගනුදෙනුවකින් ම සිදුවන බලපෑමේ වැඩිවීම. ධන (+) ලෙසටත්, අඩු වීම ඍණ () ලෙසටත් දෙයාකාර වේ. මෙසේ ධන හෝ ඍණ වශයෙන් ඇතිවන වෙනස්වීම් ගිණුම්වල වාර්තා කරයි. මෙම ක්‍රමය ද්විත්ව සටහන් න්‍යාය ලෙස හැඳින්වේ.

## ගිණුම (Account)

**"ව්‍යාපාරික ගනුදෙනුවලට අදළ ද්විත්ව බලපෑමේ ස්වරූපය නිවැරදි ව හර සහ බැර වශයෙන් සටහන් කිරීමට යොදා ගන්නා ආකෘතිය" ගිණුම නම් වේ.**

මෙසේ ව්‍යාපාරික ගනුදෙනුවක් ගිණුමකට නිවැරදි ව හර සහ බැර වශයෙන් සටහන් කිරීම පිණිස අදළ ගනුදෙනුවේ ද්විත්ව ස්වරූපය හඳුනා ගත යුතු වේ.

ගිණුමක දක්නට ලැබෙන මූලිකාංග තුනකි.

- ගිණුමේ නම/ශීර්ෂය (ගිණුමේ ඉහළ තිරස් අතට ලිවීම් කෙරේ)
- ගිණුමේ වම් පැත්ත ('හර' පැත්ත ලෙස නම් කෙරේ)
- ගිණුමේ දකුණු පැත්ත ('බැර' පැත්ත ලෙස නම් කෙරේ)

ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක ආකෘතිය හා එහි අඩංගු තොරතුරු පහත නිරූපණය කෙරේ.

හර ........................................ ගිණුම බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම රු ශත | දිනය | විස්තරය | ස පි | වටිනාකම රු ශත |
|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |

- (1) සහ (5) මගින් ගනුදෙනුව සිදු වූ දිනය
- (2) සහ (6) මගින් ද්විත්ව සටහනට අනුව, අනෙක් ගිණුමේ නම
- (3) සහ (7) මගින් ද්විත්ව සටහනට සම්බන්ධ වූ අනෙක් ගිණුම ඇති පිටුවේ (සගල පිටුවේ) අංකය.
- (4) සහ (8) මගින් ගනුදෙනුවේ වටිනාකම රුපියල් ශත වශයෙන් ලිවීම

## ගිණුම් වර්ග

ඔබට ගිණුම්කරණ සමීකරණය මතකද? එහි අඩංගු සංරචකයන් වූයේ,

- වත්කම්
- අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය)
- වගකීම් වේ.

ගිණුම්කරණයේ දී මෙම සංරචකවල වෙනස් වීම් වාර්තා කිරීම සඳහා ඒවාට වෙන වෙනම ගිණුම් පිළියෙල කරනු ලැබේ. මේ අනුව වත්කම් ගිණුම්, ප්‍රාග්ධන ගිණුම් හා වගකීම් ගිණුම් යනුවෙන් ගිණුම් වර්ග තුනක් හඳුනාගත හැකි වේ.

මෙම වත්කම් ගිණුම්, ප්‍රාග්ධන ගිණුම් හා වගකීම් ගිණුම්වලට අමතර ව, සමහර ව්‍යාපාරික ගනුදෙනු තුළින් අයිතිකරුගේ හිමිකමේ වෙනස්කම් ඇති කරවන සිදුවීම් ද සිදු වූ බව නිදසුන (01) පියුමිගේ ව්‍යාපාරයේ **ගනුදෙනු අංක** (5), (8) සහ (10) අධ්‍යයනය කිරීමෙන් ඔබට අවබෝධ වනු ඇත. ඒවා පහත දැක්වේ.

### ගනුදෙනු 5

20xx.05.14 ව්‍යාපාරය රුපියල් 5,000 ක් දුරකථන ගාස්තු ගෙවීම.

### ගනුදෙනු 8

20xx.05.19 රුපියල් 2,500 ක බදුකුලී ආදායමක් ව්‍යාපාරයට ලැබීම.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ගනුදෙනු 10

20XX.05.23 පියුමි ව්‍යාපාරයෙන් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රුපියල් 1,000 ක බඩු තොගයක් ලබා ගැනීම.

මෙවැනි ගනුදෙනු තුළින් අයිතිකරුගේ හිමිකම්වල වෙනස්කම් (හිමිකම අඩු වීම හෝ හිමිකම වැඩි වීම) සිදුවේ. මෙසේ අයිතිකරුගේ හිමිකම්වල වෙනස්කම් ඇති කෙරෙන ගිණුම් වර්ග දෙකකි.

- ආදයම් / ලාභ ගිණුම් නිදසුන බදුකුලී ආදායම් ලැබීම (ගනුදෙනු අංක 8)
- වියදම් / අලාභ ගිණුම් නිදසුන දුරකතන ගාස්තු ගෙවීම (ගනුදෙනු අංක 5)

ගනුදෙනු අංක (10) හිමිකම අඩුවීමට බලපාන නමුත් එය ආදායම් හා වියදම් යන ගිණුම් දෙවර්ගයටම අයත් නොවේ. එය අයිතිකරු තමා යෙදූ ප්‍රාග්ධනය ආපසු ලබා ගැනීමකි. භාණ්ඩ ගැනිලි හා මුදල් ගැනිලි මෙම වර්ගයට අයත් වේ. ඒවා ගැනිලි නම් වූ හිමිකම අඩුවීමට බලපාන ගිණුමක තාවකාලිකව සටහන් කරනු ලැබේ.

මේ අනුව පරිච්ඡේදයේ සඳහන් ඉහත කොටස අධ්‍යයනය කිරීමෙන් ඔබට ගිණුම් වර්ග පහක් (5) හඳුනා ගත හැකි ය. ඒවා උදහරණ සහිතව පහත දැක්වේ.

| ගිණුම් වර්ග | උදහරණ |
|---|---|
| වත්කම් ගිණුම් | • ලී බඩු ගිණුම<br>• මුදල් ගිණුම |
| වගකීම් ගිණුම් | • බැංකු ණය ගිණුම<br>• වෙළෙඳ ණයහිමි ගිණුම |
| වියදම් ගිණුම් | • දුරකථන ගාස්තු ගිණුම<br>• වැටුප් හා වේතන ගිණුම |
| ආදයම් ගිණුම් | • විකුණුම් ගිණුම<br>• ලැබූ වට්ටම් ගිණුම |
| හිමිකම් ගිණුම් (ප්‍රාග්ධන ගිණුම්) | • ප්‍රාග්ධන ගිණුම<br>• ලාභාලාභ ගිණුමේ ශේෂය (කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපාරයේ ආදයම් සහ වියදම් ගැලපීමෙන් ලැබෙන ශේෂය)<br>• ගැනිලි ගිණුම (හිමිකම අඩුවේ) |

ඔබ විසින් ඉහතින් හඳුනාගත් ගිණුම් වර්ග පහ (05) රූප සටහන 4.2 මගින් ඉදිරිපත් කළ හැකි ය.




**රූප සටහන 4.2 ගිණුම් වර්ග**

## ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීම

ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි ගනුදෙනු සටහන් කරනුයේ ගිණුමක ය. මෙහිදී අදාළ ගනුදෙනු ගිණුමේ,

- හර (Debit) සටහන්
- බැර (Credit) සටහන් ලෙස ගිණුම්ගත කෙරේ.

ඔබ දැනටමත් දන්නා පරිදි ගිණුමේ වම් පැත්තේ හර සටහන් ද දකුණු පැත්තේ බැර සටහන් ද තබනු ලැබේ.

ව්‍යාපාරයක සිදුවන මුදලින් මැන දැක්විය හැකි සියලු ම ගනුදෙනු එක් එක් ගිණුම්වල හර ලෙසත්, බැර ලෙසත් සටහන් කෙරෙන්නේ ගනුදෙනුවක ද්විත්ව ස්වරූපයට අනුව ය.

ව්‍යාපාරයක ගිණුම් සියල්ල අඩංගු පොත **ලෙජරය** (Ledger) ලෙස හැඳින් වේ. පරිගණක ආශ්‍රයෙන් ගිණුම් පවත්වාගෙන යන ව්‍යාපාරයක මූලික ගිණුම් පවත්වාගෙන යනු ලබන ලිපි ගොනුව "ප්‍රධාන ලෙජරය" ලෙස හැඳින්වේ. මෙවැනි විටක පරිගණකයේ ඇති චුම්බක තැටියක හෝ පටියක මෙම තොරතුරු වාර්තාකර තබා ගනු ලැබේ.

මෙසේ ගිණුම්වල ව්‍යාපාරික ගනුදෙනු සටහන් කිරීම පිණිස ද්විත්ව සටහන් රීති (මූලධර්ම) භාවිත කෙරේ. පහත වගුව දෙස අවධානය යොමු කිරීමෙන් ඒවා අවබෝධ කරගත හැකි වනු ඇත.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| ලෙජර් ගිණුම් වර්ගය | ද්විත්ව සටහන් මූලධර්මය | | |
|---|---|---|---|
| | සාමාන්‍යයෙන් තිබිය යුතු ශේෂය | වැඩිවීම | අඩුවීම |
| වත්කම් ගිණුම් | හර | හර | බැර |
| වගකීම් ගිණුම් | බැර | බැර | හර |
| ආදායම් ගිණුම් | බැර | බැර | හර |
| වියදම් ගිණුම් | හර | හර | බැර |
| හිමිකම් (ප්‍රාග්ධන) ගිණුම් | බැර | බැර | හර |

මෙලෙස ද්විත්ව සටහන් න්‍යායට අනුව ව්‍යාපාරික ගනුදෙනු ගිණුම්වල සටහන් කරනු ලබන අයුරු පියුමිගේ ව්‍යාපාරයේ අඩංගු ගනුදෙනු කීපයක් මගින් සලකා බලමු.

### ගනුදෙනු 1

20XX.05.01 පියුමි රුපියල් 50,000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

ව්‍යාපාරයට රු. 50,000 ක් මුදල් ලැබෙන අතර ව්‍යාපාරයේ වත්කම් සඳහා රු. 50,000 ක හිමිකමක් පියුමිට ලැබේ. ව්‍යාපාරයේ දෘෂ්ටිකෝණයෙන් මෙය පියුමි සඳහා වන බැඳීමකි.

මුදල් වත්කමකි. වත්කම් වැඩි වීම නිසා මුදල් ගිණුම හර කෙරේ. (හර සටහනකි)

**අයිතිකරුගේ හිමිකම නිරූපණය සඳහා ප්‍රාග්ධන ගිණුම බැර කෙරේ. (බැර සටහනකි)**

ලෙ. පි. 01

මුදල් ගිණුම

හර | බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| 20XX.05.01 | ප්‍රාග්ධන ගිණුම | 02 | 50,000 | 00 | | | | | |

වත්කම වැඩිවීම හර සටහනකි

ලෙ. පි. 02

ප්‍රාග්ධන ගිණුම

හර බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| | | | | | 20xx.05.01 | මුදල් ගිණුම | 01 | 50,000 | 00 |

ප්‍රාග්ධනය වැඩිවීම බැර සටහනකි

### ගනුදෙනු 2

20XX.05.07 ව්‍යාපාරය රුපියල් 10,000 ක් බැංකුවේ තැන්පත් කරමින් ජංගම ගිණුමක් ඇරඹීම.

ව්‍යාපාරයේ බැංකු වත්කම රු. 10,000 කින් වැඩිවන අතර, මුදල් වත්කම රු. 10,000 කින් අඩු වේ.

බැංකුවේ මුදල් තැන්පත් කළ නිසා එය වත්කමකි. එනිසා බැංකු ගිණුම හර කෙරේ. (හර සටහනකි) **මුදල් වත්කමකි. මුදල් අඩුවන නිසා මුදල් ගිණුම බැර කෙරේ. (බැර සටහනකි)**

ලෙ. පි. 03

බැංකු ගිණුම

හර බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| 20xx.05.07 | මුදල් ගිණුම | 01 | 10,000 | 00 | | | | | |

වත්කම වැඩිවීම හර සටහනකි

ලෙ. පි. 01

මුදල් ගිණුම

හර බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| | | | | | 20xx.05.07 | බැංකු ගිණුම | 03 | 10,000 | 00 |

වත්කම් අඩුවීම බැර සටහනකි

## ගනුදෙනු 3

20XX.05.13 බැංකුවෙන් රුපියල් 30,000 ක ණයක් ලබා ගැනීම.

ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 30,000 කින් වැඩිවන අතර, බැංකුවෙන් ලබාගත් ණය මුදල සඳහා රු. 30,000 ක වගකීමක් ඇති වේ.

මුදල් වත්කමකි. මුදල් වැඩි වීම මුදල් ගිණුම හර කෙරේ. (හර සටහනකි)
**බැංකු ණය යනු වගකීමකි. එම නිසා බැංකු ණය ගිණුම බැර කෙරේ. (බැර සටහනකි.)**

ලෙ. පි. 01

මුදල් ගිණුම

හර | බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| 20XX.05.13 | බැංකු ණය ගිණුම | 06 | 30,000 | 00 | | | | | |

වත්කම වැඩිවීම හර සටහනකි

ලෙ. පි. 06

බැංකු ණය ගිණුම

හර | බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| | | | | | 20XX.05.13 | මුදල් ගිණුම | 01 | 30,000 | 00 |

වගකීම් වැඩිවීම බැර සටහනකි

## ගනුදෙනු 4

20XX.05.14 ව්‍යාපාරය රුපියල් 5,000 ක දුරකථන ගාස්තු ගෙවීම.



ව්‍යාපාරය දුරකථන ගාස්තු ගෙවීම නිසා රු. 5,000 ක වියදමක් ඇතිවන අතර මුදල් ගෙවීම නිසා රු. 5,000 කින් මුදල් වත්කම අඩු වේ.

දුරකථන ගාස්තු ගෙවීම වියදමකි. එනිසා දුරකථන ගාස්තු ගිණුම හර කෙරේ. (හර සටහනකි)
**මුදල් වත්කමකි. මුදල් අඩුවන නිසා මුදල් ගිණුම බැර කෙරේ. (බැර සටහනකි)**

ලෙ. පි. 07

හර　　　　**දුරකථන ගාස්තු ගිණුම**　　　　බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| 20xx.05.14 | මුදල් ගිණුම | 01 | 5,000 | 00 | | | | | |

වියදම් වැඩිවීම හර සටහනකි

ලෙ. පි. 01

හර　　　　**මුදල් ගිණුම**　　　　බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| | | | | | 20xx.05.14 | දුරකතන ගා. ගිණුම | 07 | 5,000 | 00 |

වත්කම් අඩුවීම බැර සටහනකි

### ගනුදෙනු 5

20XX.05.19 රුපියල් 2,500 ක බදුකුලී අදයමක් ව්‍යාපාරයට ලැබීම.

ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 2,500 කින් වැඩි වේ. බදුකුලී සඳහා මුදලක් ලැබීම යනු ව්‍යාපාරයට ආදායමකි. එනිසා රු. 2,500 ක් ආදායම වැඩි වේ.

මුදල් වත්කමකි. එනිසා මුදල් ගිණුම හර කෙරේ. (හර සටහනකි) **ව්‍යාපාරයට බදුකුලී ලැබීම ආදායමකි. එනිසා ආදායම් ගිණුම බැර කෙරේ. (බැර සටහනකි)**

ලෙ. පි. 01

හර　　　　**මුදල් ගිණුම**　　　　බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| 20xx.05.19 | ආදායම් ගිණුම | 09 | 2,500 | 00 | | | | | |

වත්කම් වැඩිවීම හර සටහනකි

ලෙ. පි. 09

හර | බදුකුලී ගිණුම | බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | | දිනය | විස්තරය | ස පි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | ශත | | | | රු. | ශත |
| | | | | | 20xx.05.19 | මුදල් ගිණුම | 01 | 2,500 | 00 |

ආදායම් වැඩිවීම බැර සටහනකි

## ක්‍රියාකාරකම් 03

පහත දැක්වෙන ව්‍යාපාරික ගනුදෙනු නිවැරදි ව ගිණුම්ගත කොට පෙන්වන්න.

- 20xx.01.01 මහින්ද රුපියල් 80,000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම.
- 20xx.01.04 විකිණීම සඳහා රුපියල් 20,000 ක භාණ්ඩ මිලට ගැනීම.
- 20xx.01.07 ව්‍යාපාරය රුපියල් 10,000 ක යන්ත්‍රයක් අජිත් සහ සමාගමෙන් ණයට ගැනීම.
- 20xx.01.09 රුපියල් 25,000 ක බැංකු ණයක් ලබා ගැනීම.
- 20xx.01.12 රුපියල් 3,000 ක් විදුලි ගාස්තු ගෙවීම.
- 20xx.01.17 අත්පිට විකුණුම් රුපියල් 12,000 කි.
- 20xx.01.20 රුපියල් 5,000 ක කොමිස් ආදායමක් ලැබීම.
- 20xx.01.24 මහින්ද ව්‍යාපාරයෙන් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රුපියල් 4,000 ක බඩු තොගයක් ගැනීම.
- 20xx.01.25 අජිත් සමාගමට රුපියල් 6,000 ක් ගෙවීම.
- 20xx.01.28 රුපියල් 3,000 ක් විදුලි ගාස්තු ගෙවීම.

## ක්‍රියාකාරකම් 04

ඔබගේ පාසල් මිතුරෙකු වූ අබ්දුල් පහත වගුව ඔබට ඉදිරිපත් කර ඇතැයි සිතන්න.

| අංකය | විස්තරය | |
|---|---|---|
| 01 | වත්කම වැඩි වීම | වගකීම වැඩි වීම |
| 02 | වියදම වැඩි වීම | වත්කම අඩු වීම |
| 03 | ආදායම වැඩි වීම | වත්කම වැඩි වීම |
| 04 | වත්කම වැඩි වීම | හිමිකම වැඩි වීම |
| 05 | හිමිකම අඩු වීම | වත්කම අඩු වීම |
| 06 | වත්කම අඩු වීම | වගකීම අඩු වීම |

අ. වගුවේ සඳහන් එක් එක් අංකය සඳහා වෙන වෙනම ව්‍යාපාරික ගනුදෙනුවක් බැගින් නම් කරන්න.

ආ. ඉහත (අ) යටතේ නම් කළ ව්‍යාපාරික ගනුදෙනු නිවැරදි ව ගිණුම්ගත කරන්න.

## ක්‍රියාකාරකම් 05

පහත දැක්වෙන වගුව නිරීක්ෂණය කරන්න.

| ගනුදෙනු අංක | ප්‍රාග්ධනය (රු) | වගකීම් (රු) | වත්කම් (රු) |
|---|---|---|---|
| 01 | +15,000 | | +15,000 |
| 02 | | +7,000 | +7,000 |
| 03 | | | +10,000<br>10,000 |
| 04 | 6,000 | | 6,000 |
| 05 | | 2,000 | 2,000 |
| 06 | +4,000 | | +12,000<br>8,000 |

මෙම එක් එක් අවස්ථාවල දී සිදුවී ඇතැයි සිතිය හැකි ගනුදෙනු දෙක බැගින් ලියන්න.

[ q [



නොමිලේ බෙදාහැරීම සඳහා ය.